# නිර්මාණ Nirmana

## කෝ ඒ අවුරුදු ?

එරබදු මල් පිපී - කොවුලන්ගෙ ගී ඇසී
අවුරුද්ද ළඟයි කී - දවස් ඇතට ඇදී

කතුරු ඔංචිලි බැඳී - ගමේ කෙළිබිම කොයී
මහා මන්දිර සැදී - තාප්පයකින් වැසී

වැටෙන විට අරුනළු - ළිඳ සමග ගනුදෙනු
දිවිපෙවෙත් අළුත්වී - සිරිත් අමතක වුණු

ලොකු සාදු නිවන් දැක - වසර ගණනක් ගෙවී
පොඩි සාදු පිටරටලු - පන්සල ද පාලුවී

එදා වාගෙම අදත් - ඉරක් පායනු ඇතී
හිස'ත ගා සෙත් පැතූ - පිරිස් අප'තර නැතී

♦ ශ්‍රියා කුමාරසිංහ
Dunedin - New Zealand

## අවුරුදු සුවඳ

අස්වනු කපා අටු කොටු පුරවා යසට
ගේ දොර පිළිසකර කර හැඩ දී රුවට
සපයා අළුත් සළු පිළි පවුලේ සැමට
සැරසෙති දනා අවුරුදු ගන්නට ජයට

අලුත් වළන් අවුරුදු බත පිසීමට
අමතක නොකර ගනු දෙනු කර වෙලාවට
සුබ නැකතින් වැඩ අල්ලා මනාපෙට
කවුරුත් පතති අවුරුදු කෑමට ජයට

තරහ මරහ අමතක කර සමා වෙලා
නෑ ගම් ගොසින් බුලතෙන් සිත පුබුදුවලා
තෑගි බෝග කෙළිසෙල්ලම් වැහි වැහැලා
අවුරුදු සමය සතුටුයි කාටත් එකලා

නද දේ රබානෙන් අවුරුදු පණිවුඩය
ඔන්චිල්ලාව පදවයි අවුරුදු සුවය
පංච දමා කැට ගසලා දිනන අය
ඔකඳව නගන කෙළිලොල් හඬ අපමණය

එරබදු මල් රතින් බබලයි පරිසරය
කෝකිල කූජනය දෙයි සුබ පණි වුඩය
හෙළ දිව ලකළු කර හෙළ සිරිතෙහි අගය
දනවන උතුම් දිනයයි අවුරුදු දිනය

කොවුල් නාද නොඇසු නාට
එරබදු මල් නොපිපු නාට
උපන් රටේ නොහිටි යාට
අවුරුදු සුව දනෙයි සිතට

♦ මධුරි අබේවික්‍රම
Harrow UK





## අවුරුදු ගමට ඇවිත්

මුතුසර සිනා නගන්නී
ඉඳු දුනු වරල මුදන්නී
මිණි කිංකිණි පාසළඹ සලන්නී
අසිරිය ගෙන එන්නී
අවුරුදු ගමට කියන්නී


අඹ කජු මාදං හිඹටු ඉදේ
දසත නැවුම් සුවදේ
වැට අද්දර මල් කිණිති ඇදේ
එරබදු කොමළි පිපේ

මුකුළු කොවුල් හඬ සමග එතී
සුවඳයි පල රසැතී
රබන් පදට රතැහිලි සැරසී
නටන වැයෙන කවි ගී

රන් ගොයමේ රන් කරල් පැසී
සිරි සරු සාර කෙතේ
ලිප් ගල මැද නැඹුල් සුවදේ
රන් කිරි බතක් ඉදේ

මාලපල්ලේ
♦ කුමුදු රොහාන් අමරසිංහ
Edmonton, London

## ඇය ඔහුට ලියූ කවි - 7
## Poetry she wrote to him - 7



ගයන්නට නොහැකි වුණු
දුක් ගීය සිත් කොණේ හැංගිලා
කියන්නට වදන් නැති
හද රිදුම කඳුළකින් බොඳ වෙලා
අසන්නට අයෙක් නැති
අයැදුමක් දුර ඈත තනි වෙලා
වයන්නට නොහැකිවුණු
වෙණ තතේ ගී තනුව ගිලිහිලා

ප්‍රේම ගීතය ගයන කොවුලන්
මා වෙතින් දුර ඇදෙන් නේ
වතුර බේරෙන දිය කඩිත්තේ
සිසිල දෙපයට දැනෙන් නේ
ගොතන මල්දම් වරළ ගැවසී
යළිදු දියටම වැටෙන් නේ
සියළු මෙපවත් දකින සිත ළඟ
නිහඬ තනිකම දැනෙන් නේ

වසත් කල නිමාවී ගිම්හාන සැඳෑ කල
එළඹිලා ඇතිය දැන්
වසන්තේ කොවුල් ගී දුරින් හෝ
ඇසෙන්නේ නැතිය දැන්
වසන්තේ මල් වරා හුල්ලන ගස්කොළන්
පමණකිය ඉතින් දැන්
වසන්තිය අසන්නේ දුරස් වී යනවාද
ඇය වෙතින් ඔබත් දැන්

(අඥාතයි) Anon - x x x

## ගී ගයපන් කොවුලෝ

තුරු හිස සැඟවී නොසිටින් කොවුලෝ
හෙළ දිව සිව් දෙස නිදහස් කොවුලෝ
බිය සැක හැර පියඹා ගොස් කොවුලෝ
අවුරුදු රස ගී ගයපන් කොවුලෝ

නව රැස් කැළුමන් විහිදයි ලහිරු
එරබදු රුක් හිනැහෙයි මල් ඉහිරු
සැමටම ලැබ සියළුම යස ඉසුරු
සුබ නව වසරක් වේවා මහරු

පියසීලි ගුණසේකර සුමනරත්න
හොරණ Sri Lanka

## අම්මා නැති අවුරුද්ද !

රත් පැහැ මල් මොට්ටු එරබදු දෙවැට දිගේ
අලසව නෙතු හරී සුළඟේ නොකර දඟේ
ගන කළුවරක සඳවත නැති අහස වගේ
අම්මා නොමැති අවුරුදු එන බවක් හැඟේ

අතිරස කැවුම් මුංගුලි නොබැදේ නිවසේ
දුක් කඳුලැල් නැගේ දෙනෙතට හොර රහසේ
පෙර දින අසිරි සිරි විඳි සැටි වී නොලසේ
මතකයෙ සුවඳ අතරින් අප සිත් සැනසේ

රබන් සුරල් නද ඇතින් රැව් දෙන් නේ
කිරිබත් පිඩක රස නැත මුව සනහන් නේ
කොහෝ කොහෝ මදසර සිත රිදවන් නේ
බක්මහ කුමරි නැත දොර ළඟ හිනැහෙන් නේ

සෙනෙහස සිහිනයක පාවී ඇදෙන විට
පාළුව තනිය සිත අසරණ කරන විට
අවුරුදු අහිමි වී ඇති බව දැනෙන විට
දුර ගිය සතුට ගෙන අම්මේ එන්න හෙට!

♦ දුලාංජලී සිරිවර්ධන
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය Sri Lanka

## සිංහළ අවුරුද්ද එයි වාසනාබර !

තද වැසි ඇද හැලී ගංගා දෙගොඩ තලා
යටකරගෙන ගෙවල් දොරවල් බිමට හෙලා
කඳු වැටි නායයාමෙන් පස් යටට ගිලා
ලක්බිම විපත් විය ලෝදම් කුපිත වෙලා

පාළුයි කුඹුරු ගොවිතැන් අස්වැන්න පිරී
ඉවරයි හවබෝග සම්පත් වතුර පිරී
ගොවිතැන් පාළු වූ විට රට දුකට හැරී
කාටත් එකසේම පාඩුයි දරනු බැරී

කොවුලා ගී ගයයි දී අවුරුදු සද්ද
අමතක කරනු බෑ සිංහල අවුරුද්ද
අතමිට සරු නැතත් ගරු කර අවුරුද්ද
ඉදියන් සුවඳ දෙන කිරිබත ගෙයි මැද්ද!

කොළයක් බුලත් රුපියල් දෙකකට මිළ වේ
වැඩිහිටියන් අතට බුලතක් දිය යුතු වේ
පොඩි පොඩි තෑගි සිහිවටනයකට නතු වේ
තිබුණත් බේද හොඳ හිත මතුකළ යුතු වේ

පතුරා රැස් කැරළි මතුවී උදා ගිර
සැනසුම සතුට සහ දියුණුව බෙදා හැර
පළවා විපත් සැප සම්පත් ළඟා කර
සිංහළ අවුරුද්ද එයි වාසනා බර!

♦ ප්‍රේමා එස් රූපසිංහ
නුගේගොඩ Sri Lanka

## බක් මාසේ අම්මේ මං එනවා !

මේ පාරත් මං එනතුරු
අම්මා මග බලන් ඇතී
පෙරුම්පුරයි මගේ සිතත්
දෝතින් සිපගන්න දෙපා

මව් රටෙනුත් අම්මගෙනුත්
වෙන්වී මේ ලෙස හිඳිද්දි
මහා මෙරක පවක් වගේ
අම්මේ මටනම් දැනෙන්නෙ

සුපිරි රටක සුපිරි විලස
සිටියත් කුමටද අම්මේ
දළදා සමිඳුන්ට වැඳලා
අවුරුදු සිරි විඳිනු වගේ

අම්මගෙ ඉහ
නෙරියෙ එල්ලි
නෑගම් යන්නට ආයෙත්
එරබදු මල් සුවඳ දිගේ
මං එනවා අම්ම ළඟට

♦ ධම්මි විජේසිංහ Canada

## ඔබ නැති අඳුරු ලොව

දවස ඇරඹෙන වෙලාවක් නැත මට නිනව්වක්
කළ යුතු රාජකාරියකුත් නැත ඉතිරිවෙලා
උදේ දවල් රෑ ලෙස දින ගෙවී ගියා
ඔබ නැති ගෙදර මම පමණක් ඉතිරි වුණා

දූ දරුවනුත් පිටවී දැන් කලක් ගොසින්
දරු මුනුපුරන් එන්නේ වසරකට වරක්
නැත කිසි අරමුණක් මේ හිස් දිවියෙ මගේ
ඇයි හිමියනි ගියේ දුක මට ඉතිරි කරන්

වුණේ මස්සිනා ඔබ මගෙ නෑකමට
නොතිබුණී ඒ නමුත් වැඩියෙන් මිතුරුකමක්
මව්පිය නෑ මිතුරු හැම ආසිරි මැද්දෙන්
අප එක්වුණේ සැමගෙම පැතුමක් ලෙසිනේ

දින සති මාස වී කාලය ගෙවී ගියේ
දුක සැප ලෙසින් ජීවිතයත් ගලා ගියා
දූ දරුවනුත් සතරක් මට උරුම වුණා
නොසිතූ නොපැතූ විටෙක ඔබ මා අතැර ගියා

පුරා පන්සාලිස් වසරක් ඔබ සමග ගෙවූ
ඒ දිවියේ අග නැත මා දැන සිටියේ
කිසිදින නැත පැතුවෙ ඔබ නැති අඳුරු ලොවක්
එනමුත් හිමියනි දැන් මා අසරණ වැන්දඹුවක් !

♦ ලුම්බිණි විතාන Langley UK

## පාළුයි මහ ගෙදර

කොහා සමග එරබදු මල් පිපි බැද්ද
විමසා බලයි නැත්තේ ඇයි කිසි සද්ද
පවුලේ සතුට එකමුතුබව කළ බද්ද
සිංහළ අවුරුද්ද මේ අවුරුද්දේ නැද්ද

අප්පච්චිගේ රුව පින්තූරයක් වෙලා
රැකවරණයට අම්මා පුතු ළඟට වෙලා
අවුරුදු දවසෙ මහ ගෙදරම පාළු වෙලා
හිත හඬනවා අවුරුදු සිරි මතක් වෙලා

කෙහෙල් කැනක් ඉදවන්නට කෙනෙකු නැහැ
වැඩ අල්ලා ගනුදෙනුවට කෙනෙකු නැහැ
හිස තෙල් ගා සුබ පැතුමට කෙනෙකු නැහැ
අප්පච්චී නැතුව අවුරුදු අපට නැහැ

ලොකු පුතු එක රටක පොඩි පුතු තව රටක
කිරි දුව කියා ඇමතූ දුව තව දෙසක
දියුණුව සොයාගෙන වෙන්වූවා මිසක
අවුරුදු කන්න ආසයි අප එක ගෙයක

යුද නැති දැහැමි පාලනයක් තියෙන කොට
නිසි කල වැසි ලැබී සරුපල ලැබෙන විට
අතමිට සරුව වැඩිවන විට හිත සතුට
අවුරුදු ජයයි මව්පියො ළඟ ඉන්න කොට

♦ කුමාරි විජේරත්න
Hounslow Middx UK

## අවුරුදු මතකය

දොලොස් මාසයක් හෙමිහිට ගෙවිලා
හිරු කුමරුගෙ ග්‍රහ මාරුව ලබලා
නැවුම් පැතුම් හදවත් තුළ රැඳිලා
බක්මහ ඇවිදින් අවුරුදු ලබලා

පලබර මාසේ බව ඇඟ වෙන්නේ
අස්වනු නෙලලා ගෙට අර ගන්නේ
කලක් වෙලේ සිට සැකසුම් වෙන්නේ
බක්මහ එනතුරු මග බල මින්නේ

පරණ ලිපේ තිබු අළු පිස ලන් නේ
හෝරාවට සුබ ලිප මෙලවෙන් නේ
නැවුම් මුට්ටියේ කිරි ඉතිරෙන් නේ
අවුරුදු අසිරියමයි දිස්වෙන් නේ

නව වසරට ආසිරි ලැබ ගන් නට
බුදුහිමි වැඳලා හිසතෙල් ගෑමට
නොනගත ලබලා පන්සල් යෑමට
බලා හිඳියි සැම අවුරුදු කෑමට

අවුරුදු අසමගි නැති සිරියා වයි
අවුරුදු සතුටින් පිරි සිරියා වයි
අවුරුදු ගමකින් එන සිරියා වයි
අවුරුදු රටටම දෙන සිරියා වයි

ඇඹිලිපිටියේ
♦ විමලා යාපා Cyprus

## තුන් හෙළ මංගල්‍යය

සළකුණු මැකීගොස් සිත් තුළ ලතැවිල් ලේ
රඳවා සෙනෙහසට මුව අග හසරැල් ලේ
ගෙවෙනා මිහිරි සුබ දිනයකි සැනසිල් ලේ
මෙයවේ ඉතින් තුන් හෙළයේ මංගල් ලේ

නෑසියො සැවොම එක දජයක සෙවණ යට
වැජඹෙති මෙවර නව අවුරුදු ලබන විට
ළිපගිනි මොළවමින් සැම එක නැකත කට
කිරිබත් පිස සුවඳ පතුරමු හැම අතට

♦ චන්ද්‍රා රෝහිණී කැටිපෙආරච්චි
ඇල්පිටිය Sri Lanka

## ගුරු ගීතය

හන්තානේ සරසවි බිම වරම් ලැබ
ජීවකයෙක්ව අද අබිසෙස් ලදිමි මම
මෙතැනට එන්න මට ඒ මග පසක් කළ
ගුරු සිහිකර ගතිමි පන්හිඳ අතට මම

වනමල් පිරුණු බඩවැටි ළඳු කැලෑ තුරු
ඇළ දොල විහඟ ගීයෙහි රසය ද මියුරු
තුරුලට මා අරං වැල්ලේ කළ අකුරු
පියාණෙනි දතිමි නුඹගෙන් ලොව අයුරු

අකුරු නැතුව දඟ කෙරුවත් සමග කොලු
වේවැල මට අමුත්තෙකු විය මිතුරු නොවූ
පන්තියෙ පළමු වූදා බිඳ වැට කඩොලු
මතකයි දිසාපාමොක් නෙත තුටු කඳුළු

රට දැය සමය රැකුමට දිවි කැප කෙරුව
සෝමා මහා දේවී කළ විකුම් බල
දස මහ යෝධයන් වැල්ලෙන් තෙල් පෙරුව
නුඹන් දතිමි සිංහ ලෙයෙහි බල මහිම

ගමෙන් පන්සලෙන් ලැබ ආසිරි වාදේ
නුඹෙන් සිප් හලෙන් ලැබගෙන නැණ ගුණයේ
සුවපත් කරමි රට දැයටම කර සේවේ
මා ලද පිනෙන් නුඹ බුදු බව ලැබුවාවේ

♦ කමණිකා මොහොට්ටිගේ
Cardiff Wales UK